සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

06 ශ්‍රේණිය

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජේසුස් වහන්සේගේ උපත මුලින්ම දැන ගත්තේ,

(1) එඬේරුන් ය. (2) ශාස්ත්‍රවන්තයින් ය.

(3) හෙරෝද් රජු ය. (4) මග්දලයායේ මරියා ය.

02. එම්මාවුස් ගමට යමින් සිටි ගෝලයින්ට මඟදී හමුවූයේ,

(1) පේදුරුතුමා ය. (2) ජේසුස් වහන්සේ ය.

(3) ස්නාවක ජොහන් ය. (4) අරිමානියේ ජොසප් ය.

03. ජේසු තුමාට පැමිණි පරීක්ෂා ගණන,

(1) 6 කි. (2) 5 කි. (3) 4 කි. (4) 3 කි.

04. බට පඳුරු අතර සැඟව තම සොහොයුරා බලා ගත්තේ,

(1) මීරියම් ය. (2) ආරෝන් ය.

(3) රජ කුමරිය ය. (4) ජෙකබෙද් ය.

05. සුවය ලැබීමෙන් පසු ස්තුති කිරීමට පැමිණි ලාදුරු රෝගීන් ගණන,

(1) දහයකි. (2) එකකි.

(3) පහකි. (4) හතකි.

- අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.

06. තමා උසස් කර ගනිමින් යාච්ඤාවේ නිරත වූයේ පරිසිවරයා ය. ( )

07. පාරේ වැටී සිටි මිනිසාට උපකාර කළේ සමාරිකයෙ කි. ( )

08. ජොර්දාන් ගඟ අසල හිඳිමින් දේශනා කළේ දාවිත් රජ තුමා ය. ( )

09. ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට සහය වූයේ කිරේනියේ සීමොන් ය. ( )

10. හන්නා සහ එල්කානාගේ පුත්‍රයා ස්නාවක ජොහන් තුමා ය. ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| **A කොටස** | **B කොටස** |
|---|---|
| 11. ජෙස්සේගේ බාල පුත්‍රයා වන්නේ | මිනිසා ය. |
| 12. අයකැමියා තුළ තිබුන ගුණාංගයකි. | පොත් ය. |
| 13. ජේසුස් වහන්සේ ඇණ ගැසූ ස්ථානය | දාවිත් ය. |
| 14. දේව නිර්මාණයේ මුදුන් මල්කඩ වන්නේ | කපාලපිටිය ය. |
| 15. බිබිලියා යන වචනයේ අර්ථය | නිහතමානිකම ය. |

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ වල හිස්තැන තුළ දී ඇති පිළිතුර යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

( පාස්කු / යෙසායා / දෙවියන් වහන්සේ / මනුෂ්‍යයා / පේදුරු)

16. බයිබලයේ ප්‍රධාන කර්තෘ .................................................................................................................................. ය.

17. බයිබලය පුරාම ඇති තේමාව දෙවියන් වහන්සේ හා ............................................................................ අතර සම්බන්ධතාවයයි.

18. ජේසුස් වහන්සේගේ ප්‍රධානම ශ්‍රාවකයා ........................................................................................... තුමාය.

19. ජේසුස් කුමරා තම දෙමව්පියන් සමඟ අවුරුදු 12 දී දේව මාලිගාවට ගියේ ........................................................ මංගල්‍යය සැමරීමටය.

20. එතියෝපිය ජාතික මිනිසා කියවමින් ගියේ ........................................................................................ ග්‍රන්ථයයි.

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) දේව මැවිල්ලේ අඛණ්ඩ බව පෙන්වීමට උදාහරණ 02 ක් ලියන්න.
    (ii) ජේසුස් වහන්සේ මරණයට පත් වූ දිනය හා නැවත නැගිටි දිනය අද අප හඳුන්වන්නේ කෙසේද?
    (iii) 'දාවිත්ගේ පුත්‍රයාණෙනි, මට අනුගම්පා කළ මැනව.' මෙසේ කීවේ කවුද? කාටද?
    (iv) බයිබලයේ මුල් පොත හා අවසාන පොත නම් කරන්න.
    (v) 'සාමුවෙල්' යන නමෙහි අර්ථය කුමක්ද?
    (vi) අද අපට එල්ල වන පරීක්ෂාවන් 02 ක් ලියන්න.
    (vii) ජුදෙව් පාස්කු මංගල්‍යය යනු කුමක්දැයි හඳුන්වන්න.
    (viii) කිතුනු දරුවෙකු ලෙස ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 02 ක් ලියන්න.

02. (i) ශුද්ධ බයිබලයේ සඳහන් පරිදි බිළිඳු ජේසු බැහැ දැකීමට පැමිණි අය නම් කරන්න.
    (ii) ජේසුස් වහන්සේ නිසි ලෙස හඳුනා ගැනීමට දේවදූතයින් දුන් ලකුණ කුමක්ද?
    (iii) අද කිතුනු ඔබ නත්තල සැමරීමට අනුගමනය කරන යහපත් පිළිවෙත් 03 ක් ලියන්න.

03. (i) ජේසු තුමා උපත ලැබූ නගරය හා ඇති දැඩි වූ නගරය නම් කරන්න.
    (ii) ස්නාවක ජොහන් තුමාගේ මව හා පියා නම් කරන්න.
    (iii) ජේසුස් වහන්සේගේ බෞතිස්මය අවස්ථාවේ සිදු වූ දේ ලියන්න.

04. (i) මෝසෙස්ගේ මව සහ පියා නම් කරන්න.
    (ii) 'මෝසෙස්' යන නම ඔහුට තැබුවේ කවුද? එම නමෙහි අර්ථය ලියන්න.
    (iii) ඔබගේ නිවසේ දී සහෝදර සහෝදරියන්ගේ යහපත උදෙසා ඉටු කළ හැකි ක්‍රියා මාර්ග 03 ක් ලියන්න.

05. (i) ශුද්ධ බයිබලයේ කොටස් දෙක නම් කරන්න.
    (ii) පංච පුස්තකයට අයත් පොත් අතරින් පොත් 03 ක් නම් කරන්න.
    (iii) ශුද්ධ බයිබලය තුළින් ඔබේ ජීවිතයට ලබා ගත හැකි දේවල් 03 ක් ලියන්න.

06. (i) මැවීම පිළිබඳ බයිබලයේ සඳහන් වන පොත නම් කරන්න.
    (ii) පරිසරය විනාශ කරන ආකාර 03 ක් ලියන්න.
    (iii) දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

01. එඬේරුන් ය. 02. ජේසුස් වහන්සේ ය. 03. 3 කි. 04. මීරියම් ය. 05. එකකි.

06. (✓) 07. (✓) 08. (X) 09. (✓) 10. (X)

11. දාවිත් ය. 12. නිහතමානීකම ය. 13. කපාලපිටිය ය. 14. මිනිසා ය. 15. පොත් ය.
16. දෙවියන් වහන්සේ 17. මනුෂ්‍යයා 18. පේදුරු 19. පාස්කු 20. යෙසායා

## II කොටස

01. (i) ඉර නැගීම, බැසීම / දරු උපත් සිදුවීම / බිත්තරයෙන් කුකුල් පැටවකු බිහි වීම. ..... ආදි
    (ii) මරණයට පත් වූ දිනය - මහ සිකුරාදා    නැවත නැගිටි දිනය - පාස්කුව
    (iii) බාර්තිමේයස් විසින් ජේසුස් වහන්සේට
    (iv) මුල් පොත - උත්පත්ති    අවසාන පොත - එළිදරව් පොත
    (v) දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත්
    (vi) සොරකම් කිරීම / කොපි කිරීම / රණ්ඩු කිරීම.... ආදි
    (vii) ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවාගෙන ඒම.
    (viii) කරුණාව, සාමය, සමාව දීම, ප්‍රේමය.... ආදී.

02. (i) එඬේරු / ශාස්ත්‍රවන්තයින්.
    (ii) රෙදි වලින් ඔතා ගවයින් කන ඔරුවක බාවා ඇති දරුවෙක්.
    (iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

03. (i) ජුදයේ බෙත්ලෙහෙම් නුවර    ගලීලයේ නාසරෙත් නුවර
    (ii) මව - එලිසබෙත්    පියා - සෙකරියස්
    (iii) ස්වර්ගය විවර වී ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියකු මෙන් පැමිණියා. හඬක් නිකුත් වුණා. ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.

04. (i) අම්රාම් සහ ජෙකබෙද්
    (ii) පාරාවෝ රජුගේ දූ කුමරිය 'වතුරෙන් ගොඩට ගත්'
    (iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

05. (i) පුරාණ ගිවිසුම / නව ගිවිසුම
    (ii) උත්පත්ති / නික්මයාම / ලෙවී ව්‍යවස්ථාව / ගණන් කථාව / ද්විතියික නීති සංග්‍රහය.
    (iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

06. (i) උත්පත්ති
    (ii) ගස් කැපීම / පරිසරයට කුණු රොඩු බැහැර කිරීම / පොලිතින් භාවිතය ආදී.....
    (iii) ගස් වැවීම / කුණු රොඩු නිසි ලෙස බැහැර කිරීම / පොලිතින් භාවිත නොකිරීම ආදි...